# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/6 - 2013 ජනවාරි මස 16 වැනි බදාදා - 2013.01.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාත් සභාව

2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තිය, 3(අ) සහ 3(අ) iii උප වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

02. 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තිය යටතේ ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය, ශෂීන්ද්‍ර රාජපක්ෂ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) ඇ සහ 2(1) ඉ උප වගන්ති යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයකු වන කොටුවිල කම්කානමලාගේ සුනිල් ගාමිණී ප්‍රැන්සිස් පෙරේරා මහතා පත් කර ඇත.

03. ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය, ශෂීන්ද්‍ර රාජපක්ෂ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 3(අ) iii වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබේ.

04. 2011 අංක 02 දරන ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය හා අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 3(අ) iii උප වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු අත්හිටුවා ඇති හෙයින්, එහි බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටු කිරීමට ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් වන මලේ පතිරණගේ නිශාන්ත මොහාන් වික්‍රමසිංහ මහතාට විධාන කරනු ලැබේ.

ශෂීන්ද්‍ර රාජපක්ෂ,
ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග,
ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා
ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය.

02-01

1A - PG 001518 — 345 (2013/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.